# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2018 අංක 33 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2018 ඔක්තෝබර් මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2018 ඔක්තෝබර් මස 05 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 8.00 | තැපැල් ගාස්තුව **:** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2018 අංක 33 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2018 ඔක්තෝබර් මස 04 වන දින]

එල්.ඩී.—ඕ. 9/2018.

### 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2018 අංක 33 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 2006 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (අ) වන ඡේදයේ "අදාළ පිරිවැටුමේ සෑම කොටසක් සම්බන්ධයෙන් ම; සහ" යන වචන වෙනුවට "අදාළ පිරිවැටුමේ සෑම කොටසක් සම්බන්ධයෙන් ම;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) වන ඡේදයේ—

(i) (ii) වන උපඡේදයේ "ලෝහ තොග ආනයනය කිරීම සම්බන්ධයෙන්; හෝ" යන වචන වෙනුවට "ලෝහ තොග ආනයනය කිරීම සම්බන්ධයෙන් ;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ii) (iii) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත උපඡේදය ආදේශ කිරීමෙන්:—

"(iii) 2017 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව නමුත් මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙර මෝටර් වාහන තොග ආනයනය කිරීම සම්බන්ධයෙන්; හෝ ";

(ඇ) (iii) වන උපඡේදයට ඉක්බිතිව ම පහත අලුත් උපඡේදය එකතු කිරීමෙන්:—

"(iv) මේ පනත ක්‍රියාත්මක වන දින හෝ ඉන් පසුව 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ පනවන ලද නිෂ්පාදන බද්දට යටත් නොවන සෑම මෝටර් වාහන තොග ආනයනය කිරීමක් සම්බන්ධයෙන් ; සහ"; සහ

(ඈ) (ආ) වන ඡේදයට ඉක්බිතිව ම පහත අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඇ) මේ පනත ක්‍රියාත්මක වන දින හෝ ඉන් පසුව, නිෂ්පාදන බද්දට යටත් වන සෑම මෝටර් වාහන තොග ආනයනය කිරීමක් සම්බන්ධයෙන් 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ පනවන ලද නිෂ්පාදන බදු ප්‍රමාණය මත;".

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඇති ව්‍යතිරේකය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කෙරේ:—

(අ) (අ) වන ඡේදයේ "සලකනු ලැබිය යුතු ය; තව ද" යන වචන වෙනුවට "සලකනු ලැබිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) වන ඡේදයේ "පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට "පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) (ආ) වන ඡේදයට ඉක්බිතිව ම පහත අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධයෙන් වන විට උපලබ්ධි නොවූ, මිල ප්‍රත්‍යාගණන වාසි සහ උපලබ්ධි නොවූ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසි, ශ්‍රී ලංකා මහ බැංකුවේ පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය.".

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන උපලේඛනය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *(ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන උපලේඛනය සංශෝධනය කිරීම.)*

(අ) එම උපලේඛනයේ 1 වන අයිතමයේ "පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් සිල්ලර වෙළෙඳාමේ යෙදී සිටින" යන වචන වෙනුවට "පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් තොග වෙළෙඳාමේ හෝ සිල්ලර වෙළෙඳාමේ යෙදී සිටින" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම උපලේඛනයේ 2 වන අයිතමයේ "පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් සිල්ලර වෙළෙඳාමේ නියැලී සිටින" යන වචන වෙනුවට "පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් තොග වෙළෙඳාමේ හෝ සිල්ලර වෙළෙඳාමේ යෙදී සිටින" යන වචන ආදේශ කිරීමෙන්.

(2) මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධන 2017 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන බවට සලකනු ලැබිය යුතු ය.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. *(අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.)*

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.